රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/සං/එල/24/2021

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2021.04.23

චක්‍රලේඛ අංක -09 /2021

සියලුම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් /
සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් / සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්
සියලුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් / සියලුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,
වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්/ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්,
විවාහ උපත් මරණ රෙජිස්ට්‍රාර්වරුන් / විවාහ රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## "ලේඛන අභිමන් 2021"
## සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

වර්ෂ 1864 දී පිහිටුවනු ලැබූ මෙම දෙපාර්තමේන්තුව දැනට වසර 157 ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියමින් දිවයිනේ පැරණිතම දෙපාර්තමේන්තුවක් ලෙස සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සිවිල් අයිතිවාසිකම් සුරකෙන අයුරින් උප්පැන්න, විවාහ සහ මරණ ලියාපදිංචි කිරීමත් ඔවුන්ගේ ඉඩම් අයිතිය සුරක්ෂිත වන පරිදි ලේඛන ලියාපදිංචි කිරීමත් යන ශ්‍රී ලංකික ජන ජීවිතයට සමීප සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති රාමුව තුල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාල හරහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නවීන මෙවලම් හා යෙදවුම් සමග විෂයට අදාල වන්නා වූ නෛතික ප්‍රතිපාදන ගලපා ගනිමින් මෙරට ඉඩම් සහ සිවිල් ලියාපදිංචි කිරීමේ ක්ෂේත්‍රයේ විද්‍යුත් තාක්ෂණික යුගය යථාර්තයක් කිරීමට උරදී සිටින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විශිෂ්ඨ නිලධාරීන් ඇගයීම අරමුණු කර ගනිමින් "ලේඛන අභිමන් 2021" ජනාධිපති සම්මාන උළෙල ප්‍රථම වරට 2021 නොවැම්බර් මස අභිමානවත් අයුරින් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අනුයුක්ත සමස්ථ නිලධාරීන්ගේ අභිප්‍රේරණය සහ සේවා තෘප්තිය ඉහල නැංවීම තුලින් ඉදිරි පස් වසර සඳහා සකස් කරන ලද දෙපාර්තමේන්තු උපායමාර්ගික සැලසුම් යතාර්ථයක් කිරීම ලේඛන අභිමන් 2021 උළෙලේ ප්‍රධාන අභිමතාර්ථය වේ.

03. උක්ත සම්මාන උළෙල සඳහා සලකා බලන කාල සීමාව 2021 ජනවාරි 01 සිට 2021 නොවැම්බර්මබර් 30 දක්වා වේ. මේ සඳහා පවත්වනු ලබන තරඟ හා සංඛේත අංක ඇමුණුම LA 01හි දක්වා ඇත.

04. "ලේඛන අභිමන් 2021" සමස්ථ තරඟාවලිය විනිශ්චය කිරීම හා සම්මාන උළෙල පැවැත්වීම සම්බන්ධයෙන් සකස් කරන ලද කාල රාමුව, වගකීම, අධීක්ෂණය හා ක්‍රියාකාරකම් ඇතුලත් ක්‍රියාකාරී සැලසුම LA 02 පරිදි වේ.

05. උක්ත සම්මාන උළෙල පැවැත්වීම සම්බන්ධව සියලු තීරණ ගැනීමේ කටයුතු ජාතික මෙහෙයුම් කමිටුව විසින් සිදුකරනු ලබන අතර සමස්ථ තරඟාවලිය තුල අවසන් තීරණය හා අභියාචනා සම්බන්ධව


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk rg@rgd.gov.lk

කටයුතු කිරීමේ බලය ජාතික මෙහෙයුම් කමිටුවේ අදහස් හා නිරීක්ෂණ මත සභාපති/රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත හිමිවේ

ජාතික මෙහෙයුම් කමිටුව පහත නිලධාරීන්ගෙන් සමන්විත වේ.

| | | | |
|---|---|---|---|
| 1 | සභාපති | රෙජිස්ට්‍රාර් ජනරාල් | ඩබ්.එම.එම.බී. වීරසේකර මහතා |
| 2 | සාමාජික | අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් | ඒ.එම්.ආර්.බී. අමරකෝන් මහතා |
| 3 | සාමාජික | ප්‍රධාන ගණකාධිකාරී | එල්.එල්.එස් ලියනආරච්චි මහතා |
| 4 | සාමාජික | ගණකාධිකාරී (ප්‍රධාන විගණක) | කේ.එම්.සී.කේ. බණ්ඩාර මහතා |
| 5 | සාමාජික | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන) | ජී.ජී.පී ලක්ශාන්ත මහතා |
| 6 | සාමාජික | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (සිවිල්) | ජී.ජී.එල්.දී ගනේපොල මිය |
| 7 | සාමාජික | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (නොතාරිස් ) | ජේ.කේ.සී.එස් ජාගොඩ ආරච්චි මිය |
| 8 | සාමාජික | ගණකාධිකාරී (සැපයුම්) | තිලංගනී පිරිස් මිය |
| 9 | සාමාජික | ගණකාධිකාරී | එච්.පී.පී කුමාරි මිය |
| 10 | සාමාජික | සහකාර් රෙජිස්ට්‍රාර් ජනරාල් | දිලූකා පි. විතානච්චි මිය |
| 11 | සාමාජික | සහකාර් රෙජිස්ට්‍රාර් ජනරාල් (නීති හා සංවර්ධන) | ආර්.ඩබ්.ටී දර් ශනි මිය |
| 12 | සාමාජික | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (නීති හා සංවර්ධන) | ජී.බී.එන් ද සොයිසා මහතා |

06. "ලේඛන අභිමන් 2021" සමස්ථ තරහාවලිය සම්බන්ධව ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශයන් පහත දක්වා ඇති අතර සියලුම නිලධාරීන් ඒ අනුව ක්‍රියාත්මක විය යුතු බව දැනුම් දෙනු ලැබේ.

i. තරහාවලිය සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්, ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීම ජාතික මෙහෙයුම් කමිටුව මගින් සිදු කරනු ලැබේ.

වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්, විවාහ රෙජිස්ට්‍රාර්වරුන් සහ උප්පැන්න / මරණ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීම ඔවුන් අධීක්ෂණය කරනු ලබන දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් මගින් සිදු කල යුතු අතර සියලු දැනුවත් කිරීම් පිළිබඳ සංෂිප්ත වාර්තාවක් lekanaabhiman2021@gmail.com විද්‍යුත් ලිපිනය වෙත එම පිටපත් හා පැමිණීමේ ලේඛන හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයේ ගොනුකර තැබිය යුතුය.

මීට අමතරව උක්ත තරහාවලිය සම්බන්ධව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් සිදුකරනු ලබන දැනුවත් කිරීම ප්‍රධාන කාර්යාලයේ ජාතික මෙහෙයුම් කමිටුව විසින් සිදු කරනු ලැබේ.

ii. "ලේඛන අභිමන් 2021" ජනාධිපති සම්මාන උළෙලේ තරඟ අංශ

| තරඟ සංකේතය | තරඟ අංශය |
|---|---|
| LA C 01 | හොඳම විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| LA C 02 | හොඳම වෛද්‍ය/උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| LA C 03 | හොඳම උප්පැන්න, විවාහ සහ මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| LA C 04 | හොඳම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| LA D 05 | හොඳම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| LA R 06 | හොඳම ලේඛනාගාරය |
| LA Z 07 | හොඳම දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය |
| LA Z 08 | හොඳම කලාප කාර්යාලය |

තරහාවලිය තරඟ අංශ 08ක් යටතේ පැවැත්වෙන අතර දිවයිනේ සියලුම විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාල, වෛද්‍ය රෙජිස්ට්‍රාර්/උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් කාර්යාල, උප්පැන්න/ විවාහ සහ මරණ රෙජිස්ට්‍රාර් කාර්යාල, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල, සියලුම දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාල, කලාප කාර්යාල සහ ලේඛනාගාර මෙම තරහාවලිය සඳහා ඉදිරිපත් විය යුතුය.

iii. අයදුම්පත් නිකුත් කිරීම / අයදුම්පත් භාර ගැනීම

| තරඟ සංකේතය | තරඟ අංශය | අයදුම්පත් නිකුත් කරන සහ භාර ගන්නා කාර්යාලය |
|---|---|---|
| LA C 01 | හොඳම විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් |
| LA C 02 | හොඳම වෛද්‍ය/උප්පැන්න/මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් |
| LA C 03 | හොඳම උප්පැන්න, විවාහ සහ මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් |
| LA C 04 | හොඳම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය | දිස්ත්‍රික් ස.රෙ.ජ කාර්යාලය |
| LA D 05 | හොඳම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය |
| LA R 06 | හොඳම ලේඛනාගාරය | ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය |
| LA Z 07 | හොඳම දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය | ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය |
| LA Z 08 | හොඳම කලාප කාර්යාලය | ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය |

(a) හොඳම විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලය , හොඳම වෛද්‍ය / උප්පැන්න / මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය, හොඳම උප්පැන්න, විවාහ සහ මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය යන තරඟ අංශ සඳහා රෙජිස්ට්‍රාර්වරුන්ට අයදුම්පත් නිකුත් කිරීම, අයදුම්පත් භාර ගැනීම, දැනුවත් කිරීම්, වාර්තා හා ලිපිගොනු පවත්වා ගැනීම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සිදු කල යුතුය.

(b) හොඳම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය යන තරඟ අංශය සඳහා අයදුම්පත් නිකුත් කිරීම, අයදුම් පත් භාර ගැනීම, දැනුවත් කිරීම්, වාර්තා හා ලිපිගොනු පවත්වා ගැනීම අදාළ දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය මගින් සිදු කල යුතුය.

(c) හොඳම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, හොඳම දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය, හොඳම කලාප කාර්යාලය සහ හොඳම ලේඛනාගාරය යන තරඟ අංශ සඳහා අයදුම්පත් නිකුත් කිරීම, අයදුම් පත් භාර ගැනීම, දැනුවත් කිරීම්, වාර්තා හා ලිපිගොනු පවත්වා ගැනීම ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය මගින් සිදු කල යුතුය.

(d) සියලුම අයදුම්කරුවන් LA 03 ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පතක් 2021/07/30 දිනට ප්‍රථම උක්ත 06. iii වගුවේ සඳහන් කාර්යාලය/අංශය වෙත ලියාපදිංචි තැපෑල් මගින් ඒවා එහි මෘදු පිටපත lekanaabhiman2021@gmail.com යන විද්‍යුත් ලිපිනය වෙත යුතුය.

(e) අයදුම්පත් භාර ගන්නා සියලුම නිලධාරීන් තමා වෙත ලැබෙන සියලුම අයදුම්පත් සඳහා දින මුද්‍රාව තබා ලේඛන ගතකර LA 04 ආකෘතියට අනුව අයදුම්පත ලැබුණු බවට අයදුම්කරු වෙත ලියාපදිංචි තැපැල් මගින් දන්වා යැවිය යුතුය.

iv. තරඟ නිර්නායක පිළිබඳ විස්තර පත්‍රිකා අයදුම්කරුවන් වෙත නිකුත් කිරීම

සියලු තරඟ අංශ සඳහා වන ඇගයීම් නිර්ණායක සහ ලකුණු දීමේ සැලැස්ම 2021/06/10 දින සිට WWW.rgd.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමේ පහසුකම ලබා දී ඇති සියලු කාර්යාල වෙත ප්‍රමාණවත් පිටපත් ප්‍රමාණයක් ලබා දීම අයදුම්පත් භාර ගන්නා නිලධාරීන්ගේ වගකීමකි.

vi. විනිශ්චය මණ්ඩල පත් කිරීම

LA C 01 / LA C 02 / LA C 03 තරඟ අංශ සඳහා

(a) තරඟ විනිශ්චය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින්, කලාප මට්ටමින් හා ජාතික මට්ටමින් සිදු කරනු ලැබේ.

(b) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සෑම විනිශ්චය මණ්ඩලයක්ම මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(c) ප්‍රාදේශීය මට්ටමේ සියලු විනිශ්චය මණ්ඩල සාමාජිකයන් වෙත LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ඇත.

(d) දිස්ත්‍රික්ක මට්ටමේ සෑම විනිශ්චය මණ්ඩලයක්ම මාණ්ඩලික නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

(e) කලාප මට්ටමේ සෑම විනිශ්චය මණ්ඩලයක්ම මාණ්ඩලික නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන් විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත

(f) ජාතික මට්ටමෙන් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලය ජාතික මෙහෙයුම් කමිටුව විසින් නිර්දේශ කරනු ලබන සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත විසින් විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

(g) විනිශ්චය මණ්ඩල සාමාජිකයන් වශයෙන් පත් කරන ලද නිලධාරීන්ගේ තොරතුරු LA 05 ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර lekanaabhiman2021@gmail.com විද්‍යුත් ලිපිනය වෙත එවිය යුතුය.

LA C 04 තරඟ අංශය සඳහා

(a) තරඟ විනිශ්චය දිස්ත්‍රික්ක මට්ටමින්, කලාප මට්ටමින් හා ජාතික මට්ටමින් සිදු කරනු ලැබේ.

(b) දිස්ත්‍රික්ක මට්ටමේ සෑම විනිශ්චය මණ්ඩලයක්ම මාණ්ඩලික නිලධාරින් 03 දෙනෙකුගෙන් සමන් විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

(c) කලාප මට්ටමේ සෑම විනිශ්චය මණ්ඩලයක්ම මාණ්ඩලික නිලධාරින් 03 දෙනෙකුගෙන් සමන් විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

(d) ජාතික මට්ටමේ සෑම විනිශ්චය මණ්ඩලයක්ම ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

(e) විනිශ්චය මණ්ඩල සාමාජිකයන් වශයෙන් පත් කරන ලද නිලධාරීන්ගේ තොරතුරු LA 05 ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර lekanaabhiman2021@gmail.com විද්‍යුත් ලිපිනය වෙත එවිය යුතුය

LA D 05

(a) තරඟ විනිශ්චය කලාප මට්ටමින් හා ජාතික මට්ටමින් සිදු කරනු ලැබේ.

(b) කලාප මට්ටමේ සෑම විනිශ්චය මණ්ඩලයක්ම මාණ්ඩලික නිලධාරින් 03 දෙනෙකුගෙන් සමන් විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

(c) ජාතික මට්ටමේ සෑම විනිශ්චය මණ්ඩලයක්ම ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

(d) විනිශ්චය මණ්ඩල සාමාජිකයන් වශයෙන් පත් කරන ලද නිලධාරීන්ගේ තොරතුරු LA 05 ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර lekanaabhiman2021@gmail.com විද්‍යුත් ලිපිනය වෙත එවිය යුතුය

LA R 06 තරඟ අංශය සඳහා

(a) තරඟ විනිශ්චය ජාතික මට්ටමින් සිදු කරනු ලැබේ.

(b) විනිශ්චය මණ්ඩලය ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් 05 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකින් සමන්විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

LA Z 07 / LA Z 08 තරඟ අංශ සඳහා

(a) තරඟ විනිශ්චය ජාතික මට්ටමින් සිදු කරනු ලැබේ.

(b) ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර LA 06 ආකෘතිය ප්‍රකාරව පත් වීම ලිපියක් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

*සංලක්ෂය

1.එක් තරඟ අංශයක් සඳහා නම් කරන ලද විනිශ්චය මණ්ඩලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ / දිස්ත්‍රික්කයේ /කලාපයේ සියලු කාර්යාල විනිශ්චය කල යුතුය.

2. යම් තරඟ අංශයක් සඳහා නම් කරන ලද විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු වෙනුවට වෙනත් සුදුසු නිලධාරියෙකු ආදේශ කිරීමේ බලය විනිශ්චය මණ්ඩල පත් කරන ලද බලධාරියා වෙත හිමිය.

සියලු තරඟ අංශ සඳහා නම් කරන ලද විනිශ්චය මණ්ඩල පිළිබඳ තොරතුරු කාර්යාලයේ ගොනු කර තබා ගත යුතුය.

## Vi. විනිශ්චය හා ප්‍රතිඵල වාර්තා කිරීම

විනිශ්චය ලබා දීම -

1. හොඳම විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලය / හොඳම වෛද්‍ය/උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය / හොඳම උප්පැන්න, විවාහ සහ මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මටමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාලය දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) දිස්ත්‍රික්ක මට්ටමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාලය කලාප මට්ටමේ ඇගයීම සඳහා සුදුසුකම් ලබයි.

(iii) කලාප මට්ටමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාලය ජාතික මට්ටමේ ඇගයීම සඳහා සුදුසුකම් ලබයි.

(iv) ජාතික මට්ටමින් ඇගයීම සඳහා කලාප 07 නියෝජනය කරමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාල 07 තෝරාගන්නා ලද අතර ඉන් ඉහලම ලකුණු ලබා ගන්නා කාර්යාලය හොඳම කාර්යාලය වශයෙන් තෝරා ගැනේ.

2. හොඳම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය

(i) දිස්ත්‍රික්ක මට්ටමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාලය කලාප මට්ටමේ ඇගයීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) කලාප මට්ටමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාලය ජාතික මට්ටමේ ඇගයීම සඳහා සුදුසුකම් ලබයි.

(iii) ජාතික මට්ටමින් ඇගයීම සඳහා කලාප 07 නියෝජනය කරමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාල 07 තෝරාගන්නා ලද අතර ඉන් ඉහලම ලකුණු ලබා ගන්නා කාර්යාලය හොඳම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය වශයෙන් තෝරා ගැනේ.

3. හොඳම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය

(i) කලාප මට්ටමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාලය ජාතික මට්ටමේ ඇගයීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) ජාතික මට්ටමින් ඇගයීම සඳහා කලාප 07 නියෝජනය කරමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාල 07 තෝරාගන්නා ලද අතර ඉන් ඉහලම ලකුණු ලබා ගන්නා කාර්යාලය හොඳම ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වශයෙන් තෝරා ගැනේ.

4. හොඳම දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය

(i) කලාප මට්ටමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාලය ජාතික මට්ටමේ ඇගයීම සඳහා සුදුසුකම් ලබයි.

(ii) ජාතික මට්ටමින් ඇගයීම සඳහා කලාප 07 නියෝජනය කරමින් ඉහලම ලකුණු ලබා ගත් කාර්යාල 07 තෝරාගන්නා ලද අතර ඉන් ඉහලම ලකුණු ලබා ගන්නා කාර්යාලය හොඳම දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වශයෙන් තෝරා ගැනේ.

(5) හොඳම කලාප කාර්යාලය

සෘජුවම ජාතික මට්ටමින් ඇගයීම සිදු කරන අතර ඉහලම ලකුණු ලබා ගන්නා කාර්යාලය හොඳම කලාප කාර්යාලය වශයෙන් තෝරා ගැනේ.

(6) හොඳම ලේඛනාගාරය

සෘජුවම ජාතික මට්ටමින් ඇගයීම සිදු කරන අතර ඉහලම ලකුණු ලබා ගන්නා ලේඛනාගාරය හොඳම ලේඛනාගාරය වශයෙන් තෝරා ගැනේ.

ප්‍රතිඵල වාර්තා කිරීම

රහසිගත භාවය ආරක්ෂාවන අයුරින් මුද්‍රා යොදා ප්‍රතිඵල වාර්තා කිරීම සිදු කල යුතුය. LA 02 හි සඳහන් ක්‍රියාත්මක සැලැස්මේ සඳහන් දිනට හෝ ඊට පෙර නියමිත ආකෘතිය අනුව ප්‍රතිඵල වාර්තා භාර දීම විනිශ්චය මණ්ඩලයේ වගකීමක් වේ.

| | ප්‍රතිපල | භාවිතා කල යුතු ආකෘතිය |
|---|---|---|
| i | ප්‍රාදේශීය මට්ටම | LA 07 |
| ii | දිස්ත්‍රික්ක මට්ටම | LA 08 |
| iii | කලාප මට්ටම | LA 09 |
| iv | ජාතික මට්ටම | LA 10 |

vii. විනිශ්චය පිළිබඳ ඇගයුම් ලාභියාගේ අදහස් දැක්වීම

සෑම තරහයක් ම විනිශ්චය කිරීමෙන් අනතුරුව අදාළ ඇගයුම් ලාභී කාර්යාල සාමාජිකයන්ගේ ප්‍රකාශය LA 11 ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර අත්සන් යොදා ප්‍රතිඵල සටහන් සමග මුද්‍රා තැබූ කවරයට බහා භාර දීම අනිවාර්ය වන අතර එසේ නොකරන ප්‍රතිඵල සටහන් ප්‍රතික්ෂේප කල යුතුය.

Viii. අභියාචනා ඉදිරිපත් කිරීම

ප්‍රාදේශීය මට්ටමේ/දිස්ත්‍රික්ක මට්ටමේ / කලාප මට්ටමේ විනිශ්චයන් ලබා දීමේදී යම් කාර්යාලයක් අගතියට පත්ව ඇත්නම් ඒ සම්බන්ධව විනිශ්චය ලබා දුන් දින සිට දින 07 ඇතුලත ලියාපදිංචි තැපැල් මගින් ඔබගේ අභියාචනය මා වෙත එවිය යුතුය. සියලු අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව පමණක් ජාතික මට්ටමේ විනිශ්චය කටයුතු සිදු කරනු ලැබේ.

ix . තරඟ සඳහා කාර්යාල සූදානම් කිරීමේ ප්‍රතිපාදන

මේ සඳහා අවශ්‍ය සියලුම ලිපි ද්‍රව්‍ය වියදම්, මුද්‍රණ වියදම් මුදල් රෙගුලාසි වලට අනුකූලව ගිණුම් අංශයෙන් කඩිනමින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. අදාල මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා බිල්පත් සමග ගෙවීම් වවුචර ගණකාධිකාරී (ගෙවීම්) වෙත යොමුකළ යුතුය.

X. විනිශ්චය මණ්ඩල සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම

ප්‍රාදේශීය මට්ටමේ විනිශ්චය මණ්ඩල සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන අතර දිස්ත්‍රික්ක මටටමේ සහ කලාප මට්ටමේ විනිශ්චය මණ්ඩල සඳහා ප්‍රවාහන පහසුකම් අදාළ කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලබා දෙනු ඇත.

ජාතික මට්ටමේ විනිශ්චය මණ්ඩල සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ප්‍රධාන කාර්යාලයේ ප්‍රවාහන අංශය විසින් ලබා දෙනු ඇත.

07. මෙම දෙපාර්තමේන්තුවේ ඉදිරි පස් වසර සඳහා සකස් කරන ලද උපායමාර්ගික සැලසුම් යතාර්ථයක් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන මානව සම්පත අභිප්‍රේරණයේ එක් අංගයක් ලෙස මෙම ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ මග පෙන්වීම සහ සක්‍රිය දායකත්වය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :-

1. ජනාධිපති ලේකම් - කාරු.දැ. ගැ සඳහා
2. ලේකම්,රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණය අමාත්‍යාංශය - කාරු.දැ. ගැ සඳහා
3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරු - කාරු.දැ. ගැ සඳහා සහ අවශ්‍ය සහය ලබා දීමට
4. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - කාරු.දැ. ගැ සඳහා සහ අවශ්‍ය සහය ලබා දීමට

# LA 01

## "ලේඛන අභිමන් 2021"
## සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

### තරඟ අංශ පිළිබඳ ලේඛනය

| අනු අංකය | තරඟ සංකේතය | තරඟ අංශය |
|---|---|---|
| 1 | LA C 01 | හොඳම විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| 2 | LA C 02 | හොඳම වෛද්‍ය/උප්පැන්න/මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| 3 | LA C 03 | හොඳම උප්පැන්න, විවාහ සහ මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| 4 | LA C 04 | හොඳම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| 5 | LA D 05 | හොඳම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය |
| 6 | LA R 06 | හොඳම ලේඛනාගාරය |
| 7 | LA Z 07 | හොඳම දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය |
| 8 | LA Z 08 | හොඳම කලාප කාර්යාලය |

- C: සිවිල් ලියාපදිංචි කිරීම් සිදු කරන කාර්යාල
- D: ලේඛන ලියාපදිංචිය සිදුකරන කාර්යාල / ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල
- Z: දිස්ත්‍රික් ස.රෙ.ජ කාර්යාල / කලාප කාර්යාල
- R: ලේඛනාගාර

LA 02

## "ලේඛන අභිමන් 2021"
## සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

### ක්‍රියාත්මක සැලසුම

| අනු අංකය | ක්‍රියාකාරකම | කාල රාමුව | වගකීම | අධීක්ෂණය |
|---|---|---|---|---|
| 1 | ලේඛන අභිමන් 2021 චක්‍රලේඛය හා තරඟ නිර්ණායක නිකුත් කිරීම | 2021.04.27 | ස.රෙ.ජ (නීති හා සංවර්ධන) | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 2 | ලේඛන අභිමන් 2021 තරඟාවලිය දිස්ත්‍රික්ක මට්ටමින් සැලසුම් කිරීම | 2021.05.10 දිනට පෙර අවසන් කලයුතුය | කලාපභාර නි.රෙ.ජ / දිස්ත්‍රික් ස.රෙ.ජ | අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 3 | ලේඛන අභිමන් 2021 තරඟාවලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සැලසුම් කිරීම | 2021.05.24 දිනට පෙර | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | කලාපභාර නි.රෙ.ජ / දිස්ත්‍රික් ස.රෙ.ජ |
| 4 | වි.උ.ම රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීම | 2021.06.10 දිනට පෙර | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් | කලාපභාර නි.රෙ.ජ / දිස්ත්‍රික් ස.රෙ.ජ |
| 5 | ලේඛන අභිමන් 2021 තරඟාවලිය ජාතික මට්ටමින් ප්‍රචාරණය | 2021.06.10 දින සිට | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (නීති හා සංවර්ධන) | ස.රෙ.ජ (නීති හා සංවර්ධන) |
| 6 | තරඟ අයදුම්පත් නිකුත් කිරීම | 2021.06.10 සිට 2021.07.10 | විෂයභාර කළමනාකරණ සේවා නිලධාරී (නීති හා සංවර්ධන අංශය) | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (නීති හා සංවර්ධන) |
| 7 | තරඟ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය | 2021.07.30 | විෂයභාර කළමනාකරණ සේවා නිලධාරී (නීති හා සංවර්ධන අංශය) | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (නීති හා සංවර්ධන) |
| 8 | තරඟ සඳහා ඉදිරිපත්වන කාර්යාල තොරතුරු කලාප මට්ටමින්/දිස්ත්‍රික්ක මට්ටමින් /ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පරිගණක ගත කිරීම | 2021.08.30 | විෂයභාර සංවර්ධන නිලධාරී (නීති හා සංවර්ධන අංශය) | අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (නීති හා සංවර්ධන) |
| 9 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ/ දිස්ත්‍රික්ක/කලාප/ජාතික මට්ටමින් නිර්දේශිත විනිශ්චය මණ්ඩල පත් කර ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කිරීම | 2021.08.10 දිනට පෙර | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අ.දි.රෙ./ දිස්ත්‍රික් | රෙජිස්ට්‍රාර් ජනරාල් |

| | | | | |
|---|---|---|---|---|
| | | | ස.රෙ.ජ. / කලාප නි.රෙ.ජ / ජාතික මෙහෙයුම් කමිටුව | |
| 10 | විනිශ්චය මණ්ඩල සභාපතිවරුන් පත් කිරීම හා සාමාජිකයන් වෙත පත්වීම් ලිපි නිකුත් කිරීම | 2021.08.15 දිනට පෙර | ජාතික මෙහෙයුම් කමිටුව | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 11 | තරඟ නිර්ණායක අනුව කාර්යාල ඇගයීම - ප්‍රාදේශීය මට්ටම | 2021.09.01 සිට 2021.09.10 දක්වා | විනිශ්චය මණ්ඩල සභාපතිවරුන් | දිස්ත්‍රික් ස.රෙ.ජ |
| 12 | ප්‍රාදේශීය මට්ටමේ විනිශ්චය දිස්ත්‍රික් මට්ටමට වාර්තා කිරීම | 2021.09.13 සිට 2021.09.17 | විනිශ්චය මණ්ඩල සභාපතිවරුන් | දිස්ත්‍රික් ස.රෙ.ජ |
| 13 | තරඟ නිර්ණායක අනුව කාර්යාල ඇගයීම - දිස්ත්‍රික් මට්ටම | 2021.09.21 සිට 2021.09.30 | විනිශ්චය මණ්ඩල සභාපතිවරුන් | කලාප භාර නි.රෙ.ජ |
| 14 | දිස්ත්‍රික් මට්ටමේ විනිශ්චය කලාප මට්ටමට වාර්තා කිරීම | 2021.10.01. සිට 2021.10.08 | විනිශ්චය මණ්ඩල සභාපතිවරුන් | කලාප භාර නි.රෙ.ජ |
| 15 | කලාප මට්ටමේ ඇගයීම | 2021.10.08 සිට 2021.10.12 | විනිශ්චය මණ්ඩල සභාපතිවරුන් | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 16 | අභියාචනා භාර ගැනීම හා විමර්ශනය | 2021.10.15 පෙර | ජාතික මෙහෙයුම් කමිටුව | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 17 | ජාතික මට්ටමේ ඇගයීම | 2021.10.20 පෙර | ජාතික මෙහෙයුම් කමිටුව | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 18 | ජාතික සම්මාන උළෙල සංවිධාන කටයුතු | 2021.10.30 පෙර | ජාතික මෙහෙයුම් කමිටුව | රෙජිස්ට්‍රාර් ජනරාල් |
| 19 | ජාතික සම්මාන උළෙල පැවැත්වීම | 2021.11.03 | ජාතික මෙහෙයුම් කමිටුව | රෙජිස්ට්‍රාර් ජනරාල් |

LA 03

“ලේඛන අභිමන් 2021”

## සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

### තරඟ අයදුම්පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. | 1.1 | තරඟයේ නම | |
| | 1.2 | තරඟ සංකේතය | |
| 2 | 2.1 | අයත් කලාපය | |
| | 2.2 | දිස්ත්‍රික්කය | |
| | 2.3 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |
| 3 | 3.1 | කාර්යාලයේ නම | |
| | 3.2 | කාර්යාලයේ ලිපිනය | |
| | 3.3 | දුරකථන අංකය | |
| | 3.4 | ෆැක්ස් අංකය | |
| | 3.4 | විද්‍යුත් තැපැල් ලිපිනය | |
| 4 | 4.1 | අයදුම්කරුගේ නම / ආයතන ප්‍රධානීගේ නම | |
| | 4.2 | අයදුම්කරු / ආයතන ප්‍රධානීගේ ජංගම දුරකථන අංකය | |
| | 4.3 | අයදුම්කරු / ආයතන ප්‍රධානීගේ WhatsApp අංකය | |
| 5 | 5.1 | කාර්යාලය වෙත ලඟා විය හැකි ගමන් මග (ආසන්නතම ප්‍රධාන නගරයේ සිට) | |

මා විසින් ඉහතින් සඳහන් කරන ලද තොරතුරු නිවැරදි බවත් තරඟයට අදාළ සියලුම තරඟ කොන්දේසිවලට හා විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙන අවසන් තීරණයන්ට එකඟ වන බවත් ප්‍රකාශ කර සිටිමි.

දිනය:.......................................... අත්සන:..........................................

ආයතන ප්‍රධානයාගේ හා අංශ ප්‍රධානියාගේ නම හා නිල මුද්‍රාව:

# LA 04

## “ලේඛන අභිමන් 2021”

## සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

## අයදුම්පත්‍රය භාර ගැනීමේ කුවිතාන්සිය

| | | |
|---|---|---|
| [redacted] | තරඟය [redacted] | [redacted] |
| [redacted] | ලේඛනගත අංකය [redacted] | [redacted] |

.........................................................................කාර්යාලයේ ..........................................(තනතුර) විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත ලැබුණු බව කාරුණිකව දන්වමි.

ඔබ විසින් ඉල්ලුම් කරන ලද තරඟයේ තරඟ කොන්දේසි, ක්‍රියාත්මක සැලැස්ම හා ඇගයීම් නිර්ණායක සහිත චක්‍රලේඛය ඔබගේ WhatsApp අංකය එවා ඇත.

......................................................

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් /

සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් / නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්

LA 05

“ලේඛන අභිමන් 2021”

සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන
කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

විනිශ්චය මණ්ඩල

| | |
|---|---|
| තරඟයේ නම | |
| තරඟ සංකේතය | |
| කලාපය: | |
| දිස්ත්‍රික්කය | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |

| විනිශ්චය මණ්ඩලය | මුලකුරු සමග නම | රාජකාරි තනතුර | ජා.හැ.අ | ජංගම දුරකථන අංකය |
|---|---|---|---|---|
| i. | | | | |
| ii. | | | | |
| iii. | | | | |
| iv. | | | | |

ඉහත නම් සඳහන් නිලධාරින් උක්ත තරඟාවලියේ විනිශ්චය මණ්ඩලය සඳහා පත්කරන ලද බව කාරුණිකව දන්වා සිටිමි.

දිනය:.......................................

.......................................

ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/

ස.රෙ.ජ/ නි.රෙ.ජ



නිල මුද්‍රාව

LA 06

“ලේඛන අභිමන් 2021”

# සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

## විනිශ්චය මණ්ඩල පත්වීම් ලිපිය

............................................මහතා/මිය/මෙය

............................................

............................................

උක්ත තරඟාවලියේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ / දිස්ත්‍රික් මට්ටමේ / කලාප මට්ටමේ / ජාතික මට්ටමේ විනිශ්චය මණ්ඩල සභාපති/සාමාජිකයෙකු ලෙස ඔබ පත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

එම විනිශ්චය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන්ගේ තොරතුරු පහත පරිදි වේ.

| | නම | තනතුර | රාජකාරි තනතුර | කාර්යාලය | ජංගම දූ.අ. |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |

මෙම තරඟාවලියේ අභිමතාර්ථයන් සාර්ථක කර ගැනීම සඳහා ඔබ ලබා දෙන සහයෝගය අගය කරමි.

*මෙම තරඟාවලියේ අභිමතාර්ථ/තරඟ කොන්දේසි/ඇගයීම් නිර්ණායක/ලකුණු දීමේ සැලැස්ම හා ක්‍රියාත්මක සැලසුම ඇතුලත් මාර්ගෝපදේශයක් මේ සමඟ ඔබ වෙත ඒවා ඇත.

ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/

සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් / නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්/

රෙජිස්ට්‍රාර් ජනරාල්



නිල මුද්‍රාව

LA 07

"ලේඛන අභිමන් 2021"

# සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

## තරඟ ප්‍රතිපල වාර්තා කිරීම - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම

| | | |
|---|---|---|
| තරඟයේ නම | | |
| තරඟ සංකේතය | | |
| කලාපය | | |
| දිස්ත්‍රික්කය | | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | |
| කාර්යාලය | | |

| අනු අංකය | කාර්යාලයේ නම | කුසලතාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | තරඟ නිර්ණායක අනුව ලකුණු | ප්‍රසාද ලකුණු | මුළු ලකුණු | % | ස්ථානය |
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| 6 | | | | | | |
| 7 | | | | | | |
| 8 | | | | | | |
| 9 | | | | | | |
| 10 | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමු.

සභාපති:..................................................

LA 08

"ලේඛන අභිමන් 2021"

සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

තරඟ ප්‍රතිපල වාර්තා කිරීම - දිස්ත්‍රික්ක මට්ටම

| | |
|---|---|
| **තරඟයේ නම** | |
| තරඟ සංකේතය | |
| **කලාපය** | |
| දිස්ත්‍රික්කය | |
| **කාර්යාලය** | |

| අනු අංකය | කාර්යාලයේ නම | කුසලතාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | තරඟ නිර්ණායක අනුව ලකුණු | ප්‍රසාද ලකුණු | මුළු ලකුණු | % | ස්ථානය |
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| 6 | | | | | | |
| 7 | | | | | | |
| 8 | | | | | | |
| 9 | | | | | | |
| 10 | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමු.

සභාපති:..................................................

# LA 09

## “ලේඛන අභිමන් 2021”

## සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

## තරඟ ප්‍රතිපල වාර්තා කිරීම - කලාප මට්ටම

| | |
|---|---|
| තරගයේ නම | |
| තරඟ සංකේතය | |
| කලාපය | |

| අනු අංකය | කාර්යාලයේ නම | කුසලතාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | තරඟ නිර්ණායක අනුව ලකුණු | ප්‍රසාද ලකුණු | මුළු ලකුණු | % | ස්ථානය |
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| 6 | | | | | | |
| 7 | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමු.

සභාපති:.................................................

නිල මුද්‍රාව

සාමාජික:.................................................

සාමාජික:.................................................

දිනය :

LA 10

"ලේඛන අභිමන් 2021"

## සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

## තරඟ ප්‍රතිපල වාර්තා කිරීම - ජාතික මට්ටම

| තරඟයේ නම | |
|---|---|
| තරඟ සංකේතය | |

| අනු අංකය | කාර්යාලයේ නම | කුසලතාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | තරඟ නිර්ණායක අනුව ලකුණු | ප්‍රසාද ලකුණු | මුළු ලකුණු | % | ස්ථානය |
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| 6 | | | | | | |
| 7 | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමු.

සභාපති:..................................................

නිල මුද්‍රාව

සාමාජික:..................................................

සාමාජික:..................................................

දිනය :

LA 11

"ලේඛන අභිමන් 2021"

## සිවිල් හා ලේඛන ලියාපදිංචි කිරීම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන් උදෙසා පිදෙන කාර්ය සාධන ජනාධිපති සම්මාන උළෙල

තරඟ විනිශ්චය පිළිබඳ ඇගයුම්ලාභී කාර්යාල සාමාජිකයන්ගේ ප්‍රකාශය

................................කලාපයේ..................................දිස්ත්‍රික්කයේ..................................................
ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ ...............................කාර්යාලය ඉදිරිපත් වූ ........................................

..............................තරඟයයේ විනිශ්චය සඳහා ....................................දින ප්‍රාදේශීය මට්ටමේ/දිස්ත්‍රික් මට්ටමේ/කලාප මට්ටමේ / ජාතික මට්ටමේ විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය පැමිණි අතර සමස්ථ විනිශ්චය පිළිබඳව සෑහීමකට පත් වන බව / නොවන බව ප්‍රකාශ කර සිටිමු.

| | | |
|---|---|---|
| නම:..................................... | නම:..................................... | නම:..................................... |
| තනතුර:................................. | තනතුර:................................. | තනතුර:................................. |
| අත්සන:................................. | අත්සන:................................. | අත්සන:................................. |
| දිනය:................................... | දිනය:................................... | දිනය:................................... |